# දේශපාලන විද්‍යාව
# 12 සහ 13 ශ්‍රේණි
# විෂය නිර්දේශය

**(2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

**සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම.**

## 1.0 හැඳින්වීම

2007 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට අදාළ පරිදි 12 ශ්‍රේණිය සඳහා නව විෂය නිර්දේශය ක්‍රියාත්මක වන්නේ 2009 වර්ෂයේ දී ය. මේ අනුව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිවලට අනුකූලව ශිෂ්‍ය නිපුණතා වර්ධනයට ඉවහල් වන පරිදි දේශපාලන විද්‍යා විෂය නිර්දේශය සකස් කර ඇත.

ඒ අනුව ඉහල මට්ටමේ දේශපාලන අවබෝධයක් හා දැනුමක් සහිත පුරවැසියෙකු බිහි කිරීම මෙම විෂය සන්ධාරය හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් අපේක්ෂිතය.

දේශපාලන විද්‍යා විෂය අරමුණු ඉටුකර ගැනීම සඳහා විෂය නිර්දේශය ප්‍රධාන නිපුණතා 16 ක් ඔස්සේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. විෂය නිර්දේශයේ පළමු කොටසින් දේශපාලන න්‍යාය හා ඒ මත පදනම් වූ ආණ්ඩුක්‍රම පිළිබඳ ව අධ්‍යයනය කිරීම අපේක්ෂා කෙරේ. මේ අනුව ප්‍රධාන නිපුණතා 10 ක් ඔස්සේ පළමු කොටසේ විෂය මාතෘකා ගොඩනැගී ඇත. ඒ අනුව දේශපාන විද්‍යාවේ ස්වභාවය, දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂෙත්‍රය, රාජ්‍යයේ ස්වභාවය, ආණ්ඩුවේ ස්වභාවය, දේශපාලන ක්‍රියාවලිය සහ යහපාලනය සඳහා හේතුවන දේශපාලන විද්‍යාවේ මූලික සංකල්ප හා රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය යන මෙතෙක් පැවති විෂය නිර්දේශයේ මාතෘකා තව දුරටත් සංවර්ධනය කරමින් ඇතුළත් කර ඇත.

කාලීන වශයෙන් වැදගත්කමක් සහිත ගැටුම්, ගැටුම් ප්‍රභවය, ගැටුම් කළමනාකරණය හා නිරාකරණය යනුවෙන් නව මාතෘකාවක් 1 වන කොටසට ඇතුළත් කර ඇත. තව දුරටත් අන්තර් ජාතික දේශපාලන ක්‍රියාවලිය ද මෙම කොටසට ඇතුළත් වන අතර විවිධ ආණ්ඩුක්‍රම ආකෘති පිළිබඳව හැදෑරීමට ද සිදුවේ. මෙහිදී ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, ප්‍රංශය, ඉංදියාව, ස්විට්ස්ටර්ලන්තය යන රටවල ආණ්ඩු ක්‍රම ආකෘති හැදෑරීමට අවස්ථාව ලැබේ.

විෂය නිර්දේශයේ දෙවන කොටසට ප්‍රධාන නිපුණතා 06 ක් ඔස්සේ මුළුමනින්ම ශ්‍රී ලංකාවේ දේශපාලන වර්ධනය ඇතුළත්වේ.

මෙම මාතෘකා යටතේ ශ්‍රී ලංකාවේ පැවති යටත් විජිත රාජ්‍යයේ ස්වභාවය හඳුනා ගැනීමටත්, නිදහසින් පසු ශ්‍රී ලංකා රාජ්‍යයේ ස්වභාවය හඳුනා ගැනීමටත් අවස්ථාව සැලසේ. තවද නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමයන් හි ස්වරූපය ද 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන් මෙන්ම සමාජය තුළ ක්‍රියාත්මක දේශපාලනයේ ස්වරූපය හඳුනා ගැනීමටත් අවස්ථාව සැලසේ. තවද ගෝලීය හා කලාපීය පරිසරය අධ්‍යයනය නමින් නවතම මාතෘකාවක් ඔස්සේ කරුණු අධ්‍යයනය අපේක්ෂා කෙරේ.

## 2.0 විෂය නිර්දේශයේ අරමුණු

- විනයානුකූල සිවිල් සමාජ ජීවිතයක් ගත කිරිම සඳහා මිනිසා පුරුදු පුහුණු කිරීම.
- රාජ්‍යය, ආණ්ඩුව සහ එම සංවිධාන දෙක හා සම්බන්ධ පරිවාර ආයතන හඳුනා ගැනීම සහ එම ආයතන වල ක්‍රියාකාරිත්වය අවබෝධකර ගැනීම.
- ඉහල මට්ටමේ දේශපාලන අවබෝධයක් සහිත සක්‍රීය දේශපාලන ජීවීන් බිහිකිරීම.
- රටේ දේශපාලන, ආර්ථික හා සමාජීය සංවර්ධන ක්‍රියාදාමයට ප්‍රතිඵලදායී අයුරින් දායකත්වයක් ලබාදීමට අවශ්‍ය මානසික මට්ටම ගොඩ නැංවීම.
- විනය ගරුක, නීති ගරුක සහ යුක්ති ගරුක යහපත් සිවිල් පුරවැසියකු ලෙස ජීවත්වීම.

**විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට**
**යෝජිත සැලැස්ම**

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද |
|---|---|---|---|
| 12 | I | 1.1 , 1.2 , 1.3 , 1.4 , 2.1 ,<br>2.2 , 3.1 ,3.2, 3.3, 4.1 ,4.2 | 100 |
| | II | 4.3 ,5.1 , 5.2<br>6.1 ,6.2 | 100 |
| | III | 7.1 , 7.2 , 8.1 , 8.2 | 100 |
| 13 | I | 9.1 , 9.2 , 10.1 , 10.2 ,<br>11.1 , 12.1 , 12.2 | 100 |
| | II | 13.1 , 13.2 , 14.1 , | 100 |
| | III | 15.1 , 15.2 , 16.1 , 16.2<br>16.3 | 100 |

## 3.0 විෂය නිර්දේශය

### 3.1 - 12 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 1. දේශපාලන විද්‍යාවේ ස්වභාවය පිළිබඳ අවබෝධයක් සහිත සහ දේශපාලන විද්‍යාව පිළිබඳ දැනුවත් භාවයකින් යුත් පුද්ගලයෙකු ලෙස කටයුතු කරයි. | 1.1 දේශපාලන විද්‍යාව සමාජ විද්‍යාවක් ලෙස අර්ථ කථනය කරයි. | **දේශපාලන විද්‍යාව හඳුනාගැනීම**<br>● **දේශපාලන විද්‍යාව සමාජ විද්‍යාවක් ලෙස**<br>• මිනිසා සහ මිනිසාගේ සමාජ හැසිරීම අධ්‍යයනය කිරීම<br>• මිනිසා නිරන්තරයෙන් ම වෙනස්වීම්වලට භාජනය වන සත්ත්වයෙකු බැවින් ස්ථිර නියතිවලින් මිනිසා අධයයනය කළ නොහැකි වීම (විද්‍යාවක් ද නැද්ද යන ගැටලුව)<br>• සාමාන්‍යකරණය කරන ලද අදහස් පමණක් පදනම් කරගෙන අධ්‍යයනය කරන්නා වූ විෂයක් වීම. | 05 |
| | 1.2 දේශපාලන විද්‍යාව සහ අනෙකුත් සමාජීය විද්‍යා විෂයයන් අතර පවත්නා සම්බන්ධතාව විග්‍රහ කරයි. | ● **දේශපාලන විද්‍යාව සහ අනෙකුත් සමාජ විද්‍යාවන්**<br>• අනෙකුත් සමාජීය විද්‍යා සහ දේශපාලන විද්‍යාව අතර අන්තර් සම්බන්ධතාව හඳුනා ගැනීම<br>• ඉතිහාසය<br>• භූගෝල විද්‍යාව<br>• ආර්ථික විද්‍යාව<br>• සමාජ විද්‍යාව<br>• දර්ශනය<br>• නීතිය | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | 1.3 දේශපාලන විද්‍යාවේ පරිණාමය පිළිබඳ අවබෝධය වර්තමාන දේශපාලන පසුබිම ගවේෂණය කිරිමේ දී යොදා ගනියි. | • **දේශපාලන විද්‍යාව අධ්‍යයන විෂයයක් ලෙස** ආරම්භය හා විකාශය<br>• ග්‍රීක යුගය<br>• රෝම යුගය<br>• මධ්‍යතන යුගය<br>• නව යුගය<br>(ඒ ඒ යුගවල දී අවධානය යොමුකළ ප්‍රධාන දේශපාලන අදහස් හඳුනා ගැනීම) | 05 |
| | 1.4 විෂයයට අනන්‍ය වූ විවිධ ප්‍රවේශ භාවිතා කරමින් දේශපාලන විද්‍යාව හදාරයි. | • **දේශපාලන විද්‍යාව අධ්‍යයන කිරීමේ ප්‍රවේශ**<br>• දාර්ශනික<br>• තුලනාත්මක<br>• ඓතිහාසික<br>• සමාජ විද්‍යාත්මක<br>• චර්යාවාදය<br>• පද්ධති විශ්ලේෂණ ක්‍රමය<br>• සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රමය<br><br>• **දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ වැදගත්කම**<br>• දේශපාලන න්‍යාය හා දර්ශනය පිළිබඳ මිනිසා සතු දැනුම වර්ධනය කිරීම.<br>• දේශපාලන න්‍යාය හා දර්ශනය පිළිබඳ නව දැනුම සොයා යෑමේ උනන්දුව වර්ධනය කිරීම.<br>• යහපත් පුරවැසියකු වීමේ පුහුණුව ලබා ගැනීම.<br>• යහපත් රාජ්‍ය තාන්ත්‍රිකයකුවීම.<br>• ජාතික හා අන්තර්ජාතික දේශපාලනය පිළිබඳ තුලනාත්මක අවබෝධයක් ලැබීම.<br>• දේශපාලන සමාජයක් තුළ ක්‍රියාකාරී දේශපාලන ජීවිතයක් ගත කිරීමට අවස්ථාව ලැබීම. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 2 දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් ව කරුණු විමර්ශනය කරයි. | 2.1 දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට අයත් විෂය කරුණු හඳාරයි. | • **දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය**<br>• දේශපාලන දර්ශනය, දේශපාලන චින්තනය, දේශපාලන න්‍යාය, දේශපාලන මතවාද<br>• රාජ්‍යය සහ ආණ්ඩුව<br>• දේශපාලන බලය<br>• දේශපාලන ක්‍රියාදාමය<br>• නීතිය සහ අධිකරණය<br>• තුලනාත්මක ආණ්ඩුක්‍රමය<br>• රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා කළමනාකරණය. | 05 |
| | 2.2 සිවිල් ජන ජීවිතය යහපත් කිරීම සඳහා දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයේ කරුණු බලපාන ආකාරය පිළිබඳ දැනුවත් පුද්ගලයකු වෙයි. | • ගැටුම් ප්‍රභවය, ගැටුම් කළමනාකරණය, ගැටුම් නිරාකරණය.<br>• අන්තර්ජාතික දේශපාලනය<br>• ප්‍රාදේශීය ආණ්ඩු කරණය<br>(මෙම විෂය කරුණු පිළිබඳ දළ අවබෝධයක් මූලික අවස්ථාවේ දී ලබා දී ඒ ඒ මාතෘකා ආශ්‍රිත පාඨ ග්‍රන්ථ කියවීමට, දත්ත සහ තොරතුරු රැස් කිරීමට සහ නියමිත ව්‍යාපෘති කිරීමට ශිෂ්‍යයන්ට මග පෙන්විය යුතු ය) | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 3.0 රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ අවබෝධ කරගැනීමට විමර්ශනශීලි ව කටයුතු කරයි. | 3.1 "රාජ්‍ය" සංකල්පය විවරණය කරයි. | **රාජ්‍යය පිළිබඳ අධ්‍යයනය**<br>● **රාජ්‍යය හඳුනා ගැනීම**<br>• සංයුතික මුලධර්ම - භූමිය, ජනගහනය, ආණ්ඩුව සහ ස්වාධිපති බලය | 05 |
| | 3.2 රාජ්‍යයේ ආරම්භය හා විකාශනය පිළිබඳ අත්දැකීම් සහිතව නූතන රාජ්‍ය සංකල්ප විමර්ශනය කරයි. . | ● **රාජ්‍යය: ආරම්භය හා විකාශනය**<br>• ග්‍රීක නාගරික රාජ්‍ය ක්‍රමය<br>• වැඩවසම් රාජ්‍ය ක්‍රමය<br>• ජාතික රාජ්‍ය ක්‍රමය ( පොලිස්, ශුභසාධක හා අවම රාජ්‍ය ආකෘති )<br>• නව රාජ්‍යයන් - පළමුවන, දෙවන සහ තුන්වන ලෝකයේ රාජ්‍යයන්හි විශේෂ ලක්ෂණ. | 05 |
| | 3.3 රාජ්‍ය සම්භවය පිළිබඳ විවිධ න්‍යායන් හා විවිධ රාජ්‍ය ආකෘතින් තුලනාත්මකව විග්‍රහ කරයි. | ● **රාජ්‍ය සම්භවය සහ රාජ්‍යයේ සවභාවය පිළිබඳ මතවාද**<br>• දේවවරම්වාදය<br>• සමාජ සම්මුතිවාදය<br>• ලිබරල්වාදය<br>• පැසිස්ට්වාදය<br>• සමාජ වාදය<br>• මාතෘ මූලික වාදය හා පීතෘ මූලික වාදය | 15 |
| | | ● **රාජ්‍ය හා සම්බන්ධ දේශපාලන සංකල්ප**<br>• රාජ්‍යය, ජාතිය, ජනවාර්ගිකත්වය හා ජාතිකත්වය<br>• රාජ්‍ය හා සමාජය<br>• රාජ්‍ය හා ආණ්ඩුව<br>• රාජ්‍ය සහ අනෙකුත් සමාජ සංවිධාන | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 4 ආණ්ඩුවේ ස්වභාවය, ආණ්ඩුක්‍රම ආකෘති සහ කාර්යභාරය පිළිබඳ පවත්නා පුළුල් අවබෝධය ප්‍රදර්ශනය කරයි. | 4.1 "ආණ්ඩුව" පිළිබඳ සංකල්පය අර්ථ කථනය කරයි. | • **ආණ්ඩුව**<br>• ආණ්ඩුව හඳුනාගැනීම<br>• ආණ්ඩුව සමාජ සංවිධානයක් ලෙස අනෙකුත් සමාජ සංවිධානවලින් වෙනස් වන ආකාරය<br>• ආණ්ඩුවේ බලය - ස්වාධිපති බලය ක්‍රියාත්මක කරන ඒජන්තවරයා ලෙස<br>• ආණ්ඩුව බලය ක්‍රියාවට නංවන ආකාරය<br>  • බලපෑම් කිරීම<br>  • සම්මුති<br>  • දඬුවම් කිරීම | 15 |
| | 4.2 ආණ්ඩුවේ බලය හා බලය බෙදීම යන ආකාරය විශ්ලේෂණාත්මකව දකියි. | • **බලය යෙදීමේ උපකරණ**<br>  • පොලීසිය<br>  • සිවිල් සේවය<br>• **ආණ්ඩුව - ව්‍යුහයන් හා කාර්යයන්**<br>  • විධායකය<br>  • ව්‍යවස්ථාදායකය<br>  • අධිකරණය | 10 |
| | 4.3 ආණ්ඩුක්‍රම වර්ග හඳුනා ගනිමින් ඒවායේ ව්‍යුහය හා කාර්යයභාරය පිළිබඳ තීක්ෂණ දෘෂ්ටිය ප්‍රදර්ශනය කරයි. | • **ආණ්ඩුවේ බලය සංවරණය කිරීමේ මාර්ග**<br>  • බලතල බෙදීම<br>  • ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ව්‍යවස්ථානුකූලවාදය<br>• **ආණ්ඩුක්‍රම ආකෘති (දේශපාලන මතවාද අනුව)**<br>  • ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී<br>  • පැසිස්ට්<br>  • සමාජවාදී<br>  • සමාජ ප්‍රජාතන්ත්‍රවාදී | 50 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | | • **ආණ්ඩුක්‍රම ආකෘති (බලය බෙදීම අනුව)**<br>    • ඒකීය<br>    • සන්ධීය<br>    • සහසන්ධීය<br><br>• **ආණ්ඩුක්‍රම ආකෘති (විධායක බලය ක්‍රියාත්මක කරන ආකාරය අනුව.)**<br>    • කැබිනට් ආණ්ඩුක්‍රම<br>    • ජනාධිපති ආණ්ඩුක්‍රම<br>    • මිශ්‍ර ආණ්ඩුක්‍රම<br>    • ඒකතන්ත්‍ර<br><br>• **ආණ්ඩුවේ කාර්යයන්**<br>    • නීතිය හා සාමය ආරක්ෂා කිරීම<br>    • ජාතික ආරක්ෂාව තහවුරු කිරීම<br>    • ජාතික ආර්ථිකය හා ජාතික සුභසාධනය ඉහළ නැංවීම<br>    • විදේශ සම්බන්ධතා හැසිරවීම<br>    • වෙනත්<br><br>ඉහත දැක්වූ කාර්යයන් අරභයා රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා කළමනාකරණය කිරීම. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 5. දේශපාලන පරිණතභාවයකින් යුතු පුද්ගලයෙකු ලෙස දේශපාලන ක්‍රියාවලියට දායක වෙයි. | 5.1 ආණ්ඩු කරණයට ජනතාව සම්බන්ධ වන විධික්‍රම ගවේෂණාත්මකව හඳුනා ගනියි. | • **දේශපාලන ක්‍රියාදාමය: ආණ්ඩුව හා ජනතාව**<br>• **ආණ්ඩුකරණයට ජනතාව සම්බන්ධ වන විධික්‍රම**<br>• නියෝජන ක්‍රම හා මැතිවරණ ක්‍රම<br>• සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම<br>• දේශපාලන පක්ෂ<br>• මහජන මතය<br>• බලපෑම් කණ්ඩායම්<br>• සිවිල් සමාජය | 20 |
| | 5.2 දේශපාලන කටයුතුවල දී ජනතාව දේශපාලනය ඉගෙන ගන්නා ආකාරය, හැසිරෙන ආකාරය, නායකත්ව කුසලතා වර්ධනය කර ගන්නා ආකාරය පැහැදිලි කර දෙයි. | • **ජනතාව දේශපාලන ජීවීන් වශයෙන්**<br>• දේශපාලන සමාජානුයෝජනය<br>• දේශපාලන චර්යාව<br>• දේශපාලන සංස්කෘතිය<br>• දේශපාලන ප්‍රචණ්ඩත්වය<br>• දේශපාලන ප්‍රභූන් | 10 |
| 6. ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය සඳහා දේශපාලන විද්‍යාවේ මූලික සංකල්ප භාවිත කරයි. | 6.1 ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයක මූලික මූලධර්ම විග්‍රහ කරයි.<br><br>6.2 ප්‍රජාතන්ත්‍රවාදය සහ යහ පාලනය අතර පවත්නා අන්තර් සම්බන්ධතාව විග්‍රහ කරයි. | • **ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ තෝරාගත් සංකල්ප**<br>• ප්‍රජාතන්ත්‍රවාදය<br>• අයිතිවාසිකම් හා යුතුකම්<br>• නිදහස හා සමානාත්මතාව<br>• නීතිය සහ නීතියේ ආධිපත්‍යය<br>• යහ පාලනය | 10<br><br>10 |

| නිපුණතා | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 07 ශ්‍රී ලංකාවේ පැවති යටත් විජිත රාජ්‍යයේ ස්වභාවය හඳුනාගනී. | 7.1 බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමය තුළ ශ්‍රී ලංකාවේ සමාජීය, ආර්ථික , ව්‍යවස්ථා සහ දේශපාලන සංවර්ධනය හඳුනාගනියි. | • **යටත් විජිත රාජ්‍යය**<br>• **බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ රාජ්‍යයේ මූලික ලක්ෂණ හා දේශපාලන සංවර්ධනය**<br>• නිර්බාධවාදී රාජ්‍යය ස්ථාපිත කිරීම කෙරෙහි බලපෑ දේශපාලන ,ආර්ථික හා සමාජමය වෙනස් වීම්.<br>• ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ (බලතල බෙදීම) යන ආයතන, නියෝජන ක්‍රමය, මැතිවරණ ක්‍රම සහ ඡන්ද බලය කෙරෙහි අවධානය යොමු කරමින් ක්‍රි.ව. 1832 සිට 1931 දක්වා ව්‍යවස්ථා සංවර්ධනය.<br>• රාජ්‍ය පරිපාලනය හා පළාත් පාලන ක්ෂේත්‍රවල සිදු වූ වෙනස්කම් - 1833 සිට 1948 දක්වා | 25 |
| | 7.2 යටත් විජිත යුගයේ ක්‍රියාත්මක වූ සමාජ ව්‍යාපාර හඳුනා ගනිමින් ඒවා ක්‍රියාත්මක වී ඇති ආකාරය විනිවිද දකියි. | • **යටත් විජිත යුගයේ ක්‍රියාත්මක වූ සමාජ ව්‍යාපාර**<br>• ආගමික පුනර්ජීවන ව්‍යාපාරය<br>• ජාතික ව්‍යාපාරය<br>• කම්කරු ව්‍යාපාරය<br>• වාමාංශික ව්‍යාපාරය | 25 |

| නිපුණතා | | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 08 | නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේ පසුබිම් සාධක හඳුනා ගනී. | 8.1 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේ පසුබිම් සාධක විග්‍රහ කරයි. | • **සෝල්බරි ,1972, 1978, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය කෙරෙහි බලපෑ දේශපාලන ආර්ථික හා සමාජීය සාධක අධ්‍යයනය**<br>• සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේ පසුබිම් සාධක<br>• 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේ පසුබිම් සාධක<br>• 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේ පසුබිම් සාධක | 25 |
| | | 8.2 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ආයතන තුලනාත්මකව අධ්‍යයනය කරයි. | • **නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම : ව්‍යුහයන් හා කාර්යයන්**<br>• ව්‍යවස්ථාදායකය<br>• විධායකය<br>• අධිකරණය<br>• රාජ්‍ය පරිපාලනය | 25 |

## 3.2 - 13 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 9. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා කළමනාකරණය පිළිබඳ විශ්ලේෂණය කරයි. | 9.1 රාජ්‍ය පරිපාලනය, ප්‍රතිපත්ති සම්පාදනය හා කළමනාකරණය විග්‍රහ කරයි. | • **රාජ්‍ය පරිපාලනය හඳුනා ගැනීම**<br>• රාජ්‍ය පරිපාලනයේ මූලිකාංග<br>• රාජ්‍ය පරිපාලනයේ වැදගත්කම<br><br>• **රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාවට නැගීම**<br>• රාජ්‍ය ප්‍රතිපත්ති හා පරිපාලනය අතර සම්බන්ධතාව<br>• රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ මූලික ලක්ෂණ හඳුනා ගැනීම.<br>• රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේදී දායක වන ආයතන. | 10 |
| | 9.2 ජනතා සුභසිද්ධිය සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා රාජ්‍ය පරිපාලනය, කළමණාකරණ මූලධර්ම සමග විග්‍රහ කරයි. | • **කළමනාකරණය**<br>• කළමනාකරණය හඳුනාගැනීම හා එහි කෘත්‍ය<br>• කළමනාකරණය හා රාජ්‍ය පරිපාලනය අතර සම්බන්ධය | 10 |
| 10. ගැටුම් නිරාකරණය සඳහා යථා යෝග්‍ය පරිදි මැදිහත් වෙයි. | 10.1 "ගැටුම්" යන්නට අර්ථ කථනය කරයි. | • **ගැටුම් හා ගැටුම් නිරාකරණය**<br>• **ගැටුම්**<br>• මූලික නිර්වචන<br>• ගැටුම් මූලාශ්‍ර<br>• ගැටුම් හා එහි කෘත්‍ය<br>• ගැටුම හා ප්‍රචණ්ඩත්වය<br>• ගැටුම හා අවිහිංසාව | 10 |
| | 10.2 ගැටුම් නිරාකරණය කිරීම සඳහා භාවිතා කරණ සංකල්ප පිළිබඳ දැනුවත්බව ප්‍රදර්ශනය කරයි. | • **ගැටුම් නිරාකරණය පිළිබඳ සංකල්ප**<br>• ගැටුම් නිරාකරණය<br>• ගැටුම් කළමනාකරණය<br>• ගැටුම් විපරිවර්තනය<br>• ගැටුම සමථනය<br>• **සාම අධ්‍යාපනය** | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 11. අන්තර්ජාතික දේශපාලනය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි. | 11.1 අන්තර්ජාතික දේශපාලන ක්‍රියාවලිය පිළිබඳ ව විවේචනාත්මක ව විමසා බලයි. | • **අන්තර්ජාතික දේශපාලනය**<br>• අන්තර්ජාතික දේශපාලනය හඳුනා ගැනීම - රැඟුම්කරුවන් හා භූමිකාවන්<br>• අන්තර් රාජ්‍ය සම්බන්ධතා පැවැත්වීමේ විධික්‍රම - විදේශ ප්‍රතිපත්ති හා තානාපති උපක්‍රම, ආර්ථික බලය, යුද්ධය<br>• අන්තර් රාජ්‍ය සම්බන්ධතා පාලනය කිරීමේ උපක්‍රම - සාමූහික සුරක්ෂිතතාව, බලතුලනය, අන්තර්ජාතික නීතිය, නිරායුධ කරණය, ලෝක ආණ්ඩුව | 20 |
| 12. උචිත පාලන ක්‍රමයක් ඇති කිරීම සඳහා ආණ්ඩුක්‍රම ආකෘති පිළිබඳ ව තුලනාත්මක ව විමසා බලයි. | 12.1 තෝරාගත් ආණ්ඩුක්‍රම ආකෘතිවල මූලික ලක්ෂණ විමසා බලයි. | • **තෝරාගත් ආණ්ඩුක්‍රම පිළිබඳ අධ්‍යයනය**<br>• ඇමෙරිකා එක්සත් ජනපදය<br>• මහා බ්‍රිතාන්‍යය<br>• ප්‍රංශය<br>• ඉන්දියාව<br>• ස්විට්සර්ලන්තය | 20 |
| | 12.2 එකී ආණ්ඩුක්‍රම ආකෘතීන් පිළිබඳ ව තුලනාත්මක ව විමර්ශනය කරයි. | • **තෝරාගත් ආණ්ඩුක්‍රම තුළ දේශපාලන ආයතන තුලනාත්මකව හැදෑරීම.**<br>• ව්‍යවස්ථාදායකය<br>• විධායකය<br>• අධිකරණය<br>• පක්ෂ ක්‍රම | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 13. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල විශේෂිත ආණ්ඩුක්‍රම ආයතනවල හා විධිවිධාන වල ස්වරූපය හඳුනා ගනී. | 13.1 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල විශේෂිත ආණුඩුක්‍රම විධිවිධාන තුලනාත්මකව විවරණය කරයි. | • **නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල විශේෂිත ආණ්ඩුක්‍රම විධිවිධාන**<br>• මූලික අයිතිවාසිකම් / භාෂා අයිතිවාසිකම් / සුළු ජන කොටස්වල අයිතිවාසිකම්<br>• මැතිවරණ ක්‍රම හා නියෝජන ක්‍රම<br>• මූල්‍ය පාලනය | 30 |
| | 13.2 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල විශේෂිත ආණ්ඩුක්‍රම ආයතන තුලනාත්මකව විවරණය කරයි. | • **1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථායටතේ ගොඩනැගූ විශේෂිත ආණ්ඩුක්‍රම ආයතන**<br>• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය - 1972<br>• ඔම්බුඩ්ස්මන් - 1978<br>• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව-1978<br>• මැතිවරණ කොමිසන් සභාව- 1978<br><br>• **ප්‍රදේශීය ආණ්ඩුකරණය : 1948 සිට මේ දක්වා**<br>• පළාත් පාලන ක්‍රමය<br>• පළාත් සභා ක්‍රමය | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 14. 1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපත්වරයාගේ බලතල හා කාර්යයන් හඳුනා ගනියි. | 14.1 1978 ආණ්ඩුක්‍රමය තුළ අනෙක් ආයතන හා සම්බන්ධව ජනාධිපතිවරයාගේ බලතල හා කාර්ය විග්‍රහ කරයි. | **1978 ආණ්ඩුක්‍රමයේ ක්‍රියාකාරිත්වය**<br>• ජනාධිපති හා කැබිනට් මණ්ඩලය<br>• ජනාධිපති හා ව්‍යවස්ථාදායකය<br>• ජනාධිපති හා අධිකරණය<br>• ජනාධිපති හා රාජ්‍ය සේවය | 40 |
| 15. සමාජය තුළ ක්‍රියාත්මක වන දේශපාලනයේ ස්වරූපය හඳුනාගනියි. | 15.1 දේශපාලන ක්‍රමය තුළ දේශපාලන පක්ෂවල කාර්යභාරය විමර්ශනය කරයි.<br><br>15.2 බලපෑම් කණ්ඩායම්, මහජන මතය හා ජන මාධ්‍ය දේශපාලන ක්‍රියාවලිය තුළ ක්‍රියාවට නැංවෙන ආකාරය පිළිබඳ විමර්ශනය කරයි. | • **ශ්‍රී ලංකාවේ වර්තමාන දේශපාලන ක්‍රියාදාමයේ ක්‍රියාකාරිකයන්**<br>• ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ හා පක්ෂ ක්‍රමය<br>• බලපෑම් කණ්ඩායම්<br>• මහජන මතය<br>• ජනමාධ්‍ය හා දේශපාලනය | 15<br><br>15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 16. ශ්‍රී ලංකාවේ ගෝලීය හා කළාපීය පරිසරය හඳුනාගනී | 16.1 සාර්ක්, ආසියාන්, යුරෝපා හවුල, බ්‍රිතාන්‍යය පොදු රාජ්‍ය මණ්ඩලය, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ප්‍රධාන අනුබද්ධිත ආයතන හා ප්‍රධාන පෙලේ රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකලාපය විමර්ශනය කරයි. | • **ගෝලීය හා කලාපීය දේශපාලනය තුළ ශ්‍රී ලංකාව**<br>• දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානය ( සාර්ක් )<br>• අග්නිදිග ආසියානු ජාතීන්ගේ - සංවිධානය (ආසියාන්)<br>• යුරෝපා එකමුතුව<br>• බ්‍රිතාන්‍යය පොදු රාජ්‍ය මණ්ඩලය<br><br>• **ශ්‍රී ලංකාව සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය**<br><br>• **තෝරාගත් බහුපාර්ශවීය ගෝලීය ආයතන සහ ශ්‍රී ලංකාව**<br>ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව, අන්තර් ජාතික රතු කුරුස කමිටුව, ප්‍රධාන ගණයේ මානව හිමිකම් සංවිධාන වන ජාත්‍යන්තර ක්ෂමා ආයතනය, මානව හිමිකම් විමර්ශන සංවිධානය ( Human Rights Watch) | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | 16.2 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය විමර්ශනය කරයි. | • **නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශීය ප්‍රතිපත්තිය**<br>• විදේශ ප්‍රතිපත්තිය හැඩ ගැසීම කෙරෙහි බල පෑ සාධක<br>• දේශීය දේශපාලන සාධක,<br>• ආගමික සාධක<br>• ආර්ථික සාධක<br>• මතවාදී සාධක<br>• බාහිර සාධක | 25 |
| | 16.3 විදේශ ප්‍රතිපත්තිය හැඩ ගැසීමට බලපෑ සාධක විශ්ලේෂණය කරමින් නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ ප්‍රවණතා විමර්ශනය කරයි. | • නිදහසින් පසු ශ්‍රී ලංකා විදේශීය ප්‍රතිපත්තියේ ප්‍රවණතා | 15 |

## 4.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

විෂය නිර්දේශයේ අන්තර්ගත විෂය කරුණු වඩා සාර්ථක ඉගෙනුම් අත්දැකීම් බවට පරිවර්තනය කිරීම සඳහා සෑම ශිෂ්‍යයෙකුටම සහභාගී විය හැකි වැඩ සටහන් සම්පාදනය කිරීම පාසල් පාලන අධිකාරීන්ගේ වගකීමක් වෙයි. පහත දැක්වෙන්නේ එවැනි විෂය සමගාමී ක්‍රියාකාරකම් කිහිපයකි.

- දේශපාලන විද්‍යා සංගමයක් පිහිටුවීම, මෙමගින් දැනුම මිනුම් වැඩසටහන්, විවාද, ප්‍රදර්ශන, බිත්ති පුවත් පත් හා වාර ප්‍රකාශන වැනි විවිධ කාර්යයන් සඳහා සිසුන් යොමු කිරීම.
- අධ්‍යයනය චාරිකා සංවිධානය කිරීම
- පුද්ගලයින් හා පොත්පත් මුලාශ්‍ර වශයෙන් ගෙන කුඩා පරිමාණයේ පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කිරීම, මෙමගින් විවිධ වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීමට පෙළඹවීම.
- දේශපාලනික වශයෙන් වැදගත් වන පුද්ගලයින් පිළිබඳ තොරතුරු සොයා වාර්තා ගත කිරීම සඳහා ව්‍යාපාතියක් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රදේශයේ ඇති විශ්ව විද්‍යාල, උසස් අධ්‍යාපන ආයතන හා වෙනත් ආයතන සමග අත්දැකීම් හුවමාරුකර ගැනීමට යොමු කිරීම.
- ජාත්‍යන්තර සඟරා, අන්තර් ජාලය භාවිතය ඇසුරින් දැනුම වර්ධනය කර ගැනීමට යොමු කිරීම.

## 5.0 ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

දේශපාලන විද්‍යා විෂයයට අදාළ ව පංති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කරගැනීම සඳහා පහත සඳහන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපා අනුගමනය කළ හැකිය.

* බුද්ධි කලම්භන සාකච්ජා
* සඟරා නිර්මාණය කිරීම
* ප්‍රශ්නෝත්තර සංග්‍රහ සකස් කිරීම
* විවාද පැවැත්වීම
* අත්පත්‍රිකා සකස් කිරීම

## 6 . 0 තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ඇගයීම් උපකරණ නිර්මාණාත්මකව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිතය.

13 වන ශ්‍රේණිය අවසානයේ දී ජාතික මට්ටමේ ඇගයීම වන අ.පො.ස. ( උසස් පෙළ ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිතය.

මෙම විෂය නිර්දේශය පදනම් කර ගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමු වරට 2011 වර්ෂයේදී පැවැත්වේ.

මෙම විභාගයේ ප්‍රශ්න පත්‍ර වල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර විභාග දෙපාර්තමේන්තුව මගින් සැපයෙනු ඇත.